# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 274/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 15/02/2024 පැය 1925

## මාධ්‍ය නිවේදනය

**සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය .**

2024.02.14 වන දින සවස් කාලයේදී මිද්දෙනිය ප්‍රදේශයේදී නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් නීති විරෝධී ආකාරයෙන් වත්කම් උපයා ගැනීම සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයට අදාලව මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් විශුද්ධිකරණය කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වූ උලහිටියාව, මිද්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි**

සැකකරු 2007 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුල මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද මුදල් භාවිතා කරමින් මිද්දෙනිය ප්‍රදේශයේ පර්චස් 18 ක පිහිටි දෙමහල් නිවසක් ,රූට් 03ක ඉඩම හා තෙමහල් ගොඩනගිල්ල හා කාර් රථ 02ක් මිලදී ගෙන ඇති බවට අනාවරණය වීම මත මුදල් විශුද්ධි කරණය වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අත්අඩංගුවට ගෙන ඇත.

එමෙන්ම ඉහත දේපළ වලට හා  වරකාපොළ ප්‍රදේශයේ පිහිටි විකුණුම් කර ඔප්පුවකට අදාළ ඉඩමක් සඳහාද  ක්‍රියා විරහිත කිරිමේ නියමයක්ද ලබා ගෙන ඇති අතර එම දේපළ වල මුළු වටිනාකම දළ වශයෙන් මුදල් රුපියල් මිලියන 50 කට අධික බවට නිරීක්ෂණය වී ඇත.

නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**